ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - උඩරට |
| දිනය | 2016.01.14 |

## ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නුවරඑළියට ප්‍රාදේශීය කාර්යාලයක්

ග්‍රාමීය ආර්ථික කටයුතුවලට පහසුකම් සැලසීම සහ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම මඟින් ප්‍රාදේශීයව කටයුතු කිරීම තවදුරටත් පුළුල් කිරීමේ අරමුණෙන්, 2016 ජනවාරි මස 17 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව නුවරඑළියේ ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ නිලධාරීන් මෙන්ම වාණිජ බැංකුවල සහ රජයේ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා විසින් මෙම ප්‍රාදේශීය කාර්යාලය විවෘත කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මධ්‍යම පළාත තුල උසස් නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් වැඩ සටහන් කිහිපයක් පවත්වන ලදී. එහිදී විශේෂයෙන් ම මධ්‍යම පලාතේ වැවිලි අංශයේ සේවක පිරිසට ඔවුන්ගේ අර්ථ සාධක පාරිතෝෂිකයන් ලබා ගැනීමේ කටයුතු ඉතා පහසුවෙන් සිදු කර ගැනීමට අවස්ථාව සලසා දෙනු වස්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ මහ බැංකු ශාඛාවක් විවෘත කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය. නුවරඑළිය දිස්ත්‍රික්කය මූලික වශයෙන් වැවිලි කර්මාන්තය වැඩි වශයෙන් සිදු කෙරෙන දිස්ත්‍රික්කයක් හෙයින් එහි අළුතෙන් මහ බැංකු ශාඛාවක් විවෘත කිරීම මඟින් නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල අර්ථ සාධක අරමුදල හා බැඳි සේවා කටයුතු වඩාත් පහසුවෙන් සිදු කරලීමට හැකි වන අතර මතු දැක්වෙන කටයුතු ද වඩාත් සඵලදායීව කිරීමට අවකාශ ලැබෙනු ඇත.

(අ) සංවර්ධන කටයුතු සඳහා දෙනු ලබන ණය සම්බන්ධයෙන් මූල්‍ය ආයතනවලට උපදෙස් දීම සහ එම කටයුතු සම්බන්ධීකරණය කිරීම

(ආ) මහ බැංකුව විසින් හඳුන්වාදෙන ලද සහනදායී ණය ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ ඒවා පිළිබව මහ ජනතාව දැනුවත් කිරීම

(ඇ) පළාත තුල විධිමත් මූල්‍ය පහසුකම්වලට මහජනතාවට ඇති ප්‍රවේශයන් වර්ධනය කිරීම, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීම සහ විශේෂයෙන්ම ගොවි ජනතාව, භාණ්ඩ වෙළෙඳුන් සහ ආයෝජකයින් ඉලක්ක කරමින් දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම

(ඈ) දත්ත රැස් කිරීම, සමීක්ෂණ පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම, අධ්‍යාපන වැඩ සටහන් පැවැත්වීම ආදී මහ බැංකුවට සම්බන්ධ කටයුතු සිදු කිරීම

(ඉ) ණය උපදේශන පහසුකම් ලබා දීම

නුවරඑළියේ මෙම ප්‍රාදේශීය කාර්යාලය විවෘත කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල ගණන 7 ක් වනු ඇත. අනෙකුත් ප්‍රාදේශීය කාර්යාල මාතර, අනුරාධපුරය, මාතලේ, ත්‍රිකුණාමලය, යාපනය සහ කිලිනොච්චිය යන නගරවල පිහිටුවා ඇත.